**ශ්‍රී ලාංකීය පාසල් 21 වන සියවසේ අධ්‍යාපනය වෙත ගෙන යාම අරමුණු කර ක්‍රියාවට නඟන මානව සම්පත් සංවර්ධන වැඩසටහන**

# Human Resource Development Programme to take Sri Lankan Schools to 21st Century Education

**සැසිය 13 (Session 13)**

**පුනරීක්ෂණය හා ප්‍රමිති පාදක විෂයමාලා ආශ්‍රිත ප්‍රමිති හා සම්මත තත්ත්ව (Standards and Benchmarks)**

**පුනරීක්ෂණය**

1. ප්‍රමිති පාදක විෂයමාලාවක මූලික සංරචක පහ ඔබ හඳුන්වන්නේ කෙසේ ද?

**ප්‍රමිතිය** - අපේක්ෂිත ඉගෙනුම / **පුළුල් ඉගෙනුම් පලය** පෙන්වා දෙන වගන්තිය

**නිර්ණායක** - ප්‍රමිතියේ ප්‍රධාන මාන / සංරචක පෙන්වා දෙන **මධ්‍ය කාලීන ඉගෙනුම පල**

**දර්ශක** - නිර්ණායක සාක්ෂාත් වූ මට්ටම් පෙන්වා දෙන **නිරීක්ෂණය කළ හැකි** / මිනුමට ලක් කළ හැකි සාක්ෂි

**ඉගෙනුම් අද්දැකීම්** - නිර්ණායක සාක්ෂාත්කරණය සිසුන්ට පහසු කිරීම සඳහා සැලසුම් කරනු ලබන ඉගෙනුම් කාර්යයන්

**ඇගයීම** - නිර්ණායක සාක්ෂාත්කරණය සඳහා සිසුන්ට උදව් කරන **තක්සේරුව හෙවත් ඉගෙනුම සඳහා ඇගයීම (Assessment / Evaluation for Learning)** හා සිසුන් නිර්ණායක සාක්ෂාත් කළ මට්ටම් තීරණය කරන **ඇගයීම හෙවත් ඉගෙනුම පිළිබඳ ඇගයීම (Evaluation / Evaluation of Learning)**

2. ඉහත සඳහන් අංග පහෙන් **ඉගෙනුම් ක්‍රියාකාරකමක** අත්‍යවශ්‍යයෙන් ම ඇතුළත් විය යුතු සංරචක මොනවා ද?

- මධ්‍ය කාලීන ඉගෙනුම් පලය ලෙස සළකන **නිර්ණායක (Criteria)**,
- එම ඉගෙනුම් පලය සාක්ෂාත්කරණය සඳහා ලබා දිය යුතු **ඉගෙනුම් අද්දැකීම් (Learning Experiences)**,
- ඉගෙනුම් පලය සාක්ෂාත් කිරීම සඳහා සහාය වන **ඉගෙනුම සඳහා ඇගයීම** (**තක්සේරුව**)
- ඉගෙනුම් පලය සාක්ෂාත් වූ මට්ටම පෙන්වා දෙන **ඉගෙනුම පිළිබඳ ඇගයීම** (**ඇගයීම**)
- තක්සේරුව හා ඇගයීම සඳහා පසුබිම සකසන **දර්ශක (Indicators)**

3. නිපුණතා පාදක ප්‍රවේශය ඉහත සඳහන් කාරණා හඳුන්වා දී ඇත්තේ කෙසේ ද?

- පුළුල් ඉගෙනුම් පලය - **නිපුණතාව (Competency)**
- මධ්‍යකාලීන ඉගෙනුම් පල - **නිපුණතා මට්ටම් (Competency Levels)**
- මධ්‍යකාලීන ඉගෙනුම් පල සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ඉගෙනුම් අද්දැකීම් ලබා දෙන ක්‍රියාකාරකමක **නියුක්තිකරණ (Engagement)**, **ගවේෂණ (Exploration)**, **විවරණ (Explanation)** හා **විස්තාරණ (Elaboration)** පියවරවල්

- මධ්‍යකාලීන ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීම සඳහා උදව් කරන **තක්සේරුව (Assessment)** හා එම ඉගෙනුම් පල සාක්ෂාත් වූ මට්ටම් හඳුනා ගන්නා **ඇගයීම (Evaluation)**.

4. ඉංග්‍රීසි අධ්‍යාපනයට අදාළ ප්‍රමිතියක් යොදා ගනිමින් ප්‍රමිති පාදක විෂයමාලාවක මූලික සංරචක පහ ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද?

| | | |
|---|---|---|
| **ප්‍රමිතිය** | : | ලේඛනය යොදා ගනිමින් ඵලදායි සන්නිවේදනයක නිරත වෙයි. |
| **නිර්ණායකය** | : | නිවැරදි ව්‍යාකරණ භාවිත කරයි. |
| **දර්ශකය** | : | කාල, උක්ත-ආඛ්‍යාත සම්බන්ධතා හා විරාම පද නිවැරදි ව භාවිත කරමින් වැකි ලියයි. |
| **ඉගෙනුම් අද්දැකීම්** | : | ව්‍යාකරණ භාවිතය පිළිබඳ අවබෝධය ලබා දෙන ඉගෙනුම් කාර්යයන් |
| **ඇගයීම** | : | ඡේදයක් හෝ රචනාවක් ලියවීම හෝ ලිඛිත පරීක්ෂණයක නිරත කරවීම හා කල් ඇතිව තීරණය කරන ලද දර්ශක යොදා ගනිමින් කාර්ය සාධනය (Performance) මිනුමට ලක් කිරීම |

5. ඉහත (4) යටතේ සඳහන් කාරණා සළකා බලන කල මගහැරී ගොස් තිබෙන කාරණාව හඳුන්වාදෙන්නේ කෙසේ ද?
ඉගෙනුම් අද්දැකීම් ලබා දෙන අවස්ථාවේ සිදු විය යුතු තක්සේරුව හෙවත් ඉගෙනුම සඳහා ඇගයීම

6. ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමට අදාළ ඉහත සඳහන් ප්‍රමිතිය යටතේ සිදු කර තිබෙන නිර්ණායක හා දර්ශක හඳුනාගැනීම තව දුරටත් විස්තාරණය කරන්නේ කෙසේ ද?

**ලිඛිත ඉංග්‍රීසි (ලේඛනය) යොදා ගනිමින් අදහස් ඵලදායි ව සන්නිවේදනය කරයි.**

| **නිර්ණායක** | **දර්ශක** |
|---|---|
| නිවැරදි ව්‍යාකරණ භාවිත කරයි. | නිවැරදි කාල යොදා ගනිමින් ද උක්ත ආඛ්‍යාත ගලපමින් ද විරාම ලකුණු භාවිත කරමින් ද වැකි ලියයි. |
| තකර්ානුකූල ව අදහස් සංවිධානය කරයි. | හැඳින්වීම, ප්‍රධාන කොටස (කඳ) හා නිගමන අනුපිළවෙලින්, නිවැරදි ව ඉදිරිපත් කරයි. |
| අදාළ පද භාවිත කරයි. | මාතෘකාවට හා ප්‍රේක්ෂක කණ්ඩායමට (audience) ගැලපෙන පද භාවිත කරයි. |
| පැහැදිලි ව හා සංසතතාවෙන් යුතුව ලියයි. | තව ද (moreover), මන් ද යත් (because), කෙසේ වෙතත් (however) වැනි සම්බන්ධක පද (linking words) යොදා ගනිමින් අදහස් සුමට ව සම්බන්ධ කරයි. |
| උපදෙස්වලට අනුව කාර්යය නිම කරයි. | මාතෘකාව, ආකෘතිය හා වචන සීමාව නිවැරදි ව අනුමනය කරයි. |

7. ප්‍රමිති පාදක ආකෘතිය ඉගෙනුම් ප්‍රමිති, නිර්ණායක, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් හා ඇගයීම් ව්‍යවහාර අතර මෙන් ම ප්‍රමිති, නිර්ණායක හා දර්ශක අතර ද සංසතතාව සුරකින ක්‍රමයක් බව සනාථ කරන්නේ කෙසේ ද?

   - ප්‍රමිති, නිර්ණායක හා දර්ශක ශිෂ්‍ය කාර්ය සාධනය ඇගයීම සඳහා යොදා ගන්නා පුළුල්, මධ්‍යස්ථ හා සුවිශේෂ මට්ටම් නියෝජනය කරන සංරචක තුනකි.
   - ප්‍රමිතියේ විවිධ පැතිවලට අදාළ ගතිලක්ෂණ / ගුණාංග (qualities) **නිර්ණායක** ඉදිරිපත් කරයි.

- නිර්ණායක සාක්ෂාත් වූ මට්ටම් පෙන්වා දෙන නිරීක්ෂණය කළ හැකි වයර්‍ා හෝ මිනුමට ලක් කළ හැකි සාක්ෂි **දශර්ක** නම් වෙයි.
- **නිර්ණායක** ඔස්සේ ක්‍රියාකාරකම්වල නිරත වන සිසුන් අත්පත් කර ගන්නා සාධනය (Student Achievement) ඇගයිමට ලක් කිරීම සඳහා යොදා ගන්නේ දශර්කයි.
- ඉගෙනුම් ප්‍රමිති සාක්ෂාත්කරණය සඳහා හඳුනාගෙන ඇති නිර්ණායක ඉලක්ක කර ඉගෙනුම් ක්‍රියාකාරකම් සම්පාදනය සිදු කෙරෙයි.
- නිශ්චිත නිර්ණායක ඔස්සේ සිසුන් සාක්ෂාත් කර ගන්නා **ඉගෙනුම් පල** දශර්ක ඔස්සේ **සංසතතාවෙන් යුතු ව (consistently) ඇගයීමට ලක් කළ හැකි වීම** මේ එළඹුම අපට ලබා දෙන ප්‍රධාන වාසියයි.
- මෙසේ එක් පන්තියක ඉගෙනුම ලබන විවිධ සිසුන් පෙන්වන කායර් සාධනය හැරුණ විට එක ම පාසලක සමාන්තර ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන් පෙන්වන කායර් සාධනය පිළිබඳවත් විවිධ පාසල්වල එක ම ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් පෙන්වන කායර් සාධනය පිළිබඳවත් සංසතතාවෙන් යුතු විනිශ්වයන්ට එළඹීමේ හැකියාව ද අපට ලැබේ.

8. පහත දක්වා ඇත්තේ හය ශ්‍රේණියේ සිසුන්ට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා සකස් කර තිබෙන **ආදශර් ප්‍රමිති පාදක විෂයමාලාවකි**. මෙම විෂයමාලාවේ මූලික ලක්ෂණ ඔබ පෙන්වා දෙන්නේ කෙසේ ද?

**ප්‍රමිතිය 1**: සවන්දීමේ කුසලතා ප්‍රදශර්නය කරයි.

| **නිර්ණායක** | **දශර්ක** |
|---|---|
| කථා කරන්නාට හොඳින් සවන් දෙයි. | අවධානය දක්වයි. බාධා කිරීම්වලින් වැළකෙයි. ඇස් ගැටුම පවත්වා ගනිමින් ද ශරීර භාෂාව යොදා ගනිමින් ද තම උනන්දුව ප්‍රකාශයට පත් කරයි. |
| කථිකයා ඉදිරිපත් කරන ප්‍රධාන අදහස තේරුම් ගනියි. | එම අදහස ප්‍රකාශ කර සහායක අදහස්වලින් වෙනස් වන ආකරය පැහැදිලි කරයි. |
| කථිකයා ඉදිරිපත් කරන සුවිශේෂ තොරතුරු **හඳුනා ගනීයි.** | හඳුනා ගත් පුද්ගල නාම, ස්ථාන, සංඛ්‍යා, දින වැනි සුවිශේෂ කරුණු ප්‍රකාශ කරයි. |
| සවන් දීමෙන් ලබා ගත් තොරතුරු යොදා ගනිමින් නිගමනවලට එළඹෙයි. | ඇසුණ දේ ඔස්සේ සාධාරණ නිගමනවලට එළඹෙයි. |

**ප්‍රමිතිය 2:** වාචික ඉංග්‍රීසි යොදා ගනිමින් ඵලදායි සන්නිවේදනයක යෙදෙයි.

| | |
|---|---|
| පැහැදිලිව හා විශ්වාසයෙන් යුතු ව කථා කරයි. | වචන පැහැදිලි ව උච්චාරණය කරමින් හඬ නගා කථා කරයි. |
| සාකච්ඡාවලට සහභාගි වෙයි. | ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම හා අදහස් දැක්වීම සඳහා ලැබෙන අවස්ථාවලට සුදුසු ප්‍රතිචාර ලබා දෙයි. |
| සුදුසු භාෂාව යොදා ගනීයි. | පසුබිමට ගැලපෙන පද මාලා (vocabulary) හා ප්‍රකාශ (expressions) යොදා ගනියි. |

**ප්‍රමිතිය 3:** පොත්පත් කියවා තේරුම් ගනීයි.

| | |
|---|---|
| ප්‍රධාන අදහස් **හඳුනා ගනියි.** / තෝරා ගනියි. | ලේඛනයක ප්‍රධාන පණිවිඩය ප්‍රකාශ කරයි. |
| සුවිශේෂ තොරතුරු වෙන් කරයි. | ලේඛනයට ඇතුළත් කරුණු හා සම්බන්ධ ප්‍රශ්නවලට පිළිතුරු දෙයි. |
| නිගමනවලට එළඹෙයි. | දෙන ලද තොරතුරු යොදා ගනිමින් තකර්ානුකූල නිගමනවලට එළඹෙයි. |

**ප්‍රමිතිය 4:** ලිඛිත ඉංග්‍රීසි යොදා ගනිමින් ඵලදායි සන්නිවේදනයක යෙදෙයි.

| | |
|---|---|
| ව්‍යාකරණානුකූල, නිවැරදි වැකි ලියයි. | නිවැරදි කාල (tenses), උක්ත-ආඛ්‍යාත සම්බන්ධතා හා විරාම පද භාවිත කරයි. |
| තමන් සතුව ඇති පද සම්භාරය (vocabulary) යොදා ගනියි. | මාතෘකාවට හා ග්‍රාහක කණ්ඩායමට ගැලපෙන පද යොදා ගනියි. |
| අදහස් තකර්ානුකූල ව ඉදිරිපත් කරයි. | හැඳින්වීම, මූලික කොටස / කඳ හා නිගමනය නිවැරදි අනුපිළිවෙලින් ඉදිරිපත් කරයි. |
| සංසකතාවෙන් යුතු ව ලියයි. | සම්බන්ධක පද (linking words) භාවිත කරමින් අදහස් ගලා යාම පැහැදිලි ව පවත්වා ගනියි. |

**<u>ප්‍රමිති පාදක විෂයමාලා ආශ්‍රිත ප්‍රමිති හා සම්මත තත්ත්ව (Standards and Benchmarks)</u>**

1. **ශ්‍රේණි මට්ටමේ සම්මත තත්ත්ව** හඳුන්වා දී ඇත්තේ කෙසේ ද?

   කිසියම් ශ්‍රේණියක් අවසන් කරන සිසුන් දැනගත යුත්තේ (know) මොනවා ද? ඔවුන් තේරුම් ගත යුත්තේ (understand) මොනවා ද? ඔවුන්ට කළ හැකි විය යුත්තේ (do) / ආදශර්නය කළ හැකි විය යුත්තේ (demonstrate) මොනාවා ද? යන කාරණා විස්තර කරන සුවිශේෂ, මිනුමට ලක් කළ හැකි වගන්ති පෙළකි.

2. ප්‍රමිති පාදක විෂයමාලා යටතේ සම්මත තත්ත්වවල කායර් භාරය කුමක් ද?

   - **පුළුල් ප්‍රමිති**, සිසුන්ගේ වයසට හෝ එම සිසුන් ඉගෙනුම ලබන ශ්‍රේණියට හෝ ගැලපෙන **අපේක්ෂණ** (age- and grade-appropriate expectations) බවට පරිවතර්නය කිරීම,
   - අවශ්‍ය කරන ප්‍රමිතිය වෙත ඉගෙනුම්ලාභීන් ගමන් කරන බව සනාථ කිරීම සඳහා යොමු ලක්ෂ්‍යයක් (reference point) සැපයීම.

3. කණිෂ්ට ද්විතීයික මට්ටමේ (Junior Secondary Level) විද්‍යා විෂයයට අදාළ ප්‍රමිතියක් ඇසුරින් ඔබ ඉහත කාරණය පැහැදිලි කරන්නේ කෙසේ ද?

   **මට්ටම:** කණිෂ්ට ද්විතීයික **විෂයය :** විද්‍යාව
   **ප්‍රමිතිය:** සාක්ෂි මත පදනම් ව ශිෂ්‍යයා විද්‍යාත්මක සංසිද්ධි විමශර්නය කරයි.

| | |
|---|---|
| 6 ශ්‍රේණියට අදාළ සම්මත තත්ත්ව | සරළ විමශර්නයක (බීජ ප්‍රරෝහණය) විචලා හඳුනා ගෙන නිරීක්ෂණ ක්‍රමවත් ව වාතර්ා කරයි. |

| | |
|---|---|
| 7 ශ්‍රේණියට අදාළ සම්මත තත්ත්ව | සරළ විමශර්න සැලසුම් කරමින් ද අදාළ **විචල්‍යා පාලනය කරමින්** ද දත්ත එක්රැස් කරයි. |
| 8 ශ්‍රේණියට අදාළ සම්මත තත්ත්ව | සරළ විමශර්න සැලසුම් කර ක්‍රියාවට නගමින් ද එක්රැස් කරනු ලබන දත්ත විශ්ලේෂණය කරමින් ද අථර්කථන සිදු කරයි. |
| 9 ශ්‍රේණියට අදාළ සම්මත තත්ත්ව | විමශර්න සැලසුම් කර ක්‍රියාවට නගමින් ද එක්රැස් කරනු ලබන දත්ත විශ්ලේෂණයට හා අථර්කථනයට භාජනය කරමින් ද සාධාරණීයකරණය කළ හැකි නිගමනවලට (justifiable conclusions) එළඹෙයි. |

4. පහත දැක්වෙන පෙළගැස්ම ඔබ විග්‍රහ කරන්නේ කෙසේ ද?

**ප්‍රමිතිය → පාසල් මට්ටමට අදාළ නිණර්ායක → ශ්‍රේණිවලට අදාළ සම්මත තත්ත්ව → ඉගෙනුම් අද්දැකීම් → තක්සේරුව හා ඇගයීම**

- ප්‍රමිතිය සමස්ත අපේක්ෂාව ඉදිරිපත් කරන අතර ශ්‍රේණි මට්ටමේ සම්මත තත්ත්ව ඒ ඒ ශ්‍රේණිය යටතේ එම අපේක්ෂාවෙන් කිනම් ප්‍රමාණයක් සාක්ෂාත් කළ යුතු ද යන්න පෙන්වා දෙයි.
- ශ්‍රේණි මට්ටමේ සම්මත තත්ත්ව පදනම් කර ගනිමින් ඒ ඒ ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් නිරත කර විය යුතු ක්‍රියාකාරකම් තීරණය කෙරෙයි.
- මනාව සැලසුම් කරනු ලබන ක්‍රියාකාරකමක් ගුරුවරයා සිදු කළ යුතු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ ව මෙන් ම තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව ද අදහස් ලබා දෙයි.

5. ශ්‍රේණි මට්ටමේ සම්මත තත්ත්වයක ප්‍රධාන ලක්ෂණ මොනවා ද?

- ශ්‍රේණියට ගැලපීම : අදාළ ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ සංවධර්න මට්ටමට ගැලපිය යුතුයි.
- සුවිශේෂ බව : අපේක්ෂිත කායර් සාධනය (performance) පැහැදිලි ව ඉදිරිපත් කළ යුතුයි.
- මිනුමට ලක් කළ හැකි බව / නිරීක්ෂණය කළ හැකි බව :
  ඉහත ක්‍රමවලින් ලබන සාක්ෂි මත ඇගයීමට ලක් කළ හැකි විය යුතුයි.
- සංවධර්නාත්මක බව (Progressive) :
  ශ්‍රේණි ඔස්සේ ඉහළ යන විට වඩාත් සංකීණර් විය යුතුයි.
- ප්‍රමිතියට අනුගත බව (Alignment) :
  ප්‍රමිතිය සාක්ෂාත් කර ගැනිමට සෘජුව ම දායක විය යුතුයි.
- ඇගයීම් ක්‍රියාවලිය සඳහා ප්‍රයෝජනවත් වන බව :
  සිසු ප්‍රගතිය හඳුනා ගැනීම ගුරුවරුන්ට පහසු කළ යුතුයි.

මේ අනුව ශ්‍රේණි මට්ටමේ සම්මත තත්ත්වයක් යනු වඩා පුළුල් අධ්‍යාපනික ප්‍රමිතියක් වෙත යන ගමනක ප්‍රගතිය සනිටුහන් කරන සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැක්කකි. මෙය නිණර්ායකයකට සාපේක්ෂව සුවිශේෂ වුවත් තනි ඉගෙනුම් පලයකට වඩා පුළුල් වූවකි.

6. මේ වන විට ඔබ හඳුනාගෙන තිබෙන විෂයමාලා සංවර්ධන ආකෘති හතර ඒවා ඉදිරිපත් ව තිබෙන අනුපිළිවෙල අනුව පෙළ ගස්වා, එම ආකෘතිවල සංරචක - පුළුල් (broad), මධ්‍යස්ථ (intermediate), සුවිශේෂ (specific) යන මට්ටම් ඔස්සේ ඉදිරිපත් කරන්නේ කෙසේ ද?

| එළඹුම<br>**Approach** | පුළුල් මට්ටම<br>**Broad** | අතරමැදි මට්ටම<br>**Intermediate** | සුවිශේෂ මට්ටම<br>**Specific** |
|---|---|---|---|
| • අරමුණු පාදක ආකෘතිය | පරමාර්ථ | අරමුණු | සුවිශේෂ අරමුණු |
| • නිපුණතා පාදක ආකෘතිය | නිපුණතා | නිපුණතා මට්ටම් | කාර්යසාධන නිර්ණායක |
| • ප්‍රමිති පාදක ආකෘතිය | ප්‍රමිති | නිර්ණායක | දර්ශක/සම්මත තත්ත්ව |
| • පල පාදක ආකෘතිය | අපේක්ෂිත ඉගෙනුම් පල | ඉගෙනුම් පල | සුවිශේෂී ඉගෙනුම් පල |

7. ඉහත ආකෘතියට ඇතුළත් මට්ටම් තුනෙහි භාවිත අවස්ථා ඔබ පෙන්වා දෙන්නේ කෙසේ ද?

- පුළුල් මට්ටම - අතරමැදි මට්ටම තීරණය කිරීම සඳහා
- අතරමැදි මට්ටම - ඉගෙනුම හා ඉගැන්වීම මෙහෙයවන ක්‍රියාකාරකම හඳුනාගැනිම සඳහා
- සුවිශේෂ මට්ටම - ඉගෙනුම් ප්‍රතිඵල මිනුමට ලක් කරන ඇගයීම් ක්‍රමවිධි හඳුනා ගැනිම සඳහා

8. කණිෂ්ට ද්විතීයික මට්ටමේ (Junior Secondary Level) විද්‍යා විෂයයට අදාළ ප්‍රමිතියක් ඇසුරින් ඉහත සඳහන් කාරණය පැහැදිලි කරන්නේ කෙසේ ද?

**මට්ටම:** කණිෂ්ට ද්විතීයික (Junior Secondary) **විෂයය :** විද්‍යාව (Science)

**ප්‍රමිතිය:** සාක්ෂි මත පදනම් ව ශිෂ්‍යයා විද්‍යාත්මක සංසිද්ධි (Scientific Phenomena) විමශර්නය කරයි.

| | | |
|---|---|---|
| **ප්‍රමිතිය** | - | අපේක්ෂිත ඉගනුම පිළිබඳ ව ඉදිරිපත් කෙරෙන පුළුල් ප්‍රකාශයක් |
| **නිර්ණායක** | - | ප්‍රමිතියේ ප්‍රධාන පැති / සංරචක |
| **දශර්ක / සම්මත තත්ත්ව (benchmarks)** | **-** | අවධි / ශ්‍රේණිවලට අදාළ නිර්ණායක සාක්ෂාත් වූ බව හඟවන නිරීක්ෂණය කළ හැකි / මිනුමට ලක් කළ හැකි සාක්ෂි |
| **ක්‍රියාකාරකම** | - | නිර්ණායක සාක්ෂාත්කරණය සඳහා සිසුන්ට උදව් කරනු පිණිස සැලසුම් කර තිබෙන **ඉගෙනුම් අද්දැකීම්** |
| ඇගයීම | - | සිසුන් **නිර්ණායක සාක්ෂාත් කළ මට්ටම් තීරණය කරන ක්‍රම** |

9. මේ අනුව **ශ්‍රේණි මට්ටමේ සම්මත තත්ත්ව යනු මොනවා ද?**

කිසියම් ශ්‍රේණියක් අවසානයේ දී ළමුන් **දැන ගත යුත්තේ** මොනවා ද? ඔවුන් **අවබෝධ කර ගත යුත්තේ** මොනවා ද? ඔවුන්ට **කළ හැකි විය යුත්තේ** (Do) හෝ **ප්‍රදශර්නය කළ හැකි විය යුත්තේ** (Demonstrate) මොනවා ද? යන කාරණා විස්තර කරන සුවිශේෂ, මිනුමට ලක් කළ හැකි වගන්ති පෙළකි.

10. ප්‍රමිති පාදක විෂයමාලා යටතේ සම්මත තත්ත්වවල කාය්ර භාරය කුමක් ද?

අවශ්‍ය කරන ප්‍රමිතිය වෙත ඉගෙනුම්ලාභීන් ගමන් කරන බව තහවුරු කිරීම